සියලු ම හිමිකම් ඇවිරිණි. | රහස්‍ය ලේඛනයකි.


NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2019

# 52 - නර්තනය (දේශීය)
# නව නිර්දේශය

ලකුණු දීමේ පටිපාටිය




මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන/ සහකාර පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2019

නව නිර්දේශය/ புதிய பாடத்திட்டம

විෂය අංකය / பாட இலக்கம் **52**

විෂයය / பாடம் **නර්තනය (දේශීය)**

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்
## I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|
| 01. | 3 | 11. | 2 | 21. | 2 |
| 02. | 1 | 12. | 4 | 22. | 1 |
| 03. | 5 | 13. | 3 | 23. | 4 |
| 04. | 2 | 14. | 5 | 24. | 4 |
| 05. | 3 | 15. | 2 | 25. | 3 |
| 06. | 3 | 16. | 1 | | |
| 07. | 4 | 17. | 4 | | |
| 08. | 1 | 18. | 2 | | |
| 09. | 1 | 19. | 3 | | |
| 10. | 5 | 20. | 5 | | |

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு 02 ලකුණු බැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 2 × 25 = 50

# I පත්‍රය

26. සන්නියකුම / දහඅට සන්නිය

27. ව්‍යාභිචාරි

28. 14 වෙනි ලුවී

29. රටයකුම / රිද්දියාගය

30. උඩැක්කිය

31. 2 + 3 තාලය / සුළු මැදුම්

32. කථක්

33. ලෝක ධර්මී

34. කවිකාර මඩුවේ

35. හද්දා වලියකුම/වලියකුම/වලියක් මංගල්‍යය

36. i. ජස/ජසයා/පේඩිරාළ/පේඩි විදානෙ ii. කෝලම්

37. i. සබරගමු ii. තුන්සුළු දෙමහ පස්තිත / 2 + 2 + 2 + 4 + 4 පස්තිත / 2 + 2 + 2 + 4 + 4 තාලය

38. i. සැළලිහිණිය ii. කෝට්ටේ

39. i. මාරියස් පෙටීපා ii. පීටර් චෙයිකොව්ස්කි

40. i. එකතැන රැඳෙමින් කරන චලන ii. ගමන් කරමින් කරන චලන

41. i. අභිමාන යකා/අභිමානා ii. සූනියම් යක්ෂණිය

42. i. 16 ii. 24

43. i. කථක් ii. භරත

44. i. මංගර ii. ගවපට්ටි සංරක්ෂණය

45. i. සුදු ii. ඩිමරය / ඩිමර්

46. i. කෙයිමෙත්ත ii. කාඟුල / කාඟුල් තොප්පිය

47. i. භරත ii. බැලේ

48. i. නානුමුරය/දොළහ පෙළපාලිය ii. රිද්දි බිසව්

49. i. වීදාගම මෛත්‍රී හිමි ii. තොටගමුවේ ශ්‍රී රාහුල හිමි

50. i. 1974 ii. 2005

*ප්‍රශ්න අංක 01 - 25 දක්වා* **(02 x 25)** *ලකුණු 50*

*ප්‍රශ්න අංක 26 - 50 දක්වා* **(02 x 25)** *ලකුණු 50*

*මුළු ලකුණු 100*

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

(නව නිර්දේශය / புதிய பாடத்திட்டம் / New Syllabus)

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

නර්තනය - (දේශීය) II
நடனம் - (தேசிய) II
Dancing - (Indigenous) II

52 S II

2019.08.08 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස්:**

* මෙම ප්‍රශ්න පත්‍රය **I, II** හා **III** වශයෙන් කොටස් **තුනකින්** සමන්විත වේ.
* **I** කොටසේ **1** හා **2** ප්‍රශ්න අනිවාර්ය වේ.
* **II** හා **III** කොටස්වලින් අවම වශයෙන් **එක්** ප්‍රශ්නය බැගින් හෝ තෝරාගෙන, අනිවාර්ය ප්‍රශ්න **දෙක** ද ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සැපයිය යුතු ය.
* සෑම ප්‍රශ්නයකම **(i)** කොටසට ලකුණු **06**ක් ද **(ii)** කොටසට ලකුණු **06**ක් ද **(iii)** කොටසට ලකුණු **08**ක් ද වශයෙන් මුළු ලකුණු **20**ක් බැගින් හිමි වේ.

## I කොටස

**1.** (i) පහත සඳහන් කවි පදය මහ තනි තිතට අනුව ප්‍රස්තාර කරන්න.

"ඉන්ද්‍ර දිසාවට ඉඹුල් විමානෙට ඉරු දෙවි අධිපති වන්නේ"

(ii) සුරපති වන්නමේ අඩව්ව හෝ ග්‍රහදණ්ඩ තාලය සින්දු වන්නමේ ඉරට්ටිය හෝ මේස වන්නමේ අඩව්ව හෝ නිවැරදි තාල රූපයට අනුව ප්‍රස්තාර කරන්න.

(iii) මංගලම් නර්තනයට අදාළ කස්තිරම තුන්සුළු දෙමහ පස්තිතට අනුව ප්‍රස්තාර කරන්න.

**2.** දේශීය නර්තන කලාව විකාශනය වීමේ දී රාජ්‍ය අනුග්‍රහය මෙන් ම භාරතීය සංස්කෘතික ලක්ෂණ ද බලපා ඇති බව මූලාශ්‍රය මගින් හෙළි වේ.

(i) ගම්පළ යුගයේ දී නර්තන කලාවට බලපෑ භාරතීය ආභාසය කෙබඳු දැයි සාධක **දෙකක්** මගින් පෙන්වා දෙන්න.

(ii) දඹදෙණි හා කුරුණෑගල යුගවල භාවිත වාද්‍ය භාණ්ඩ පිළිබඳ තොරතුරු සාහිත්‍යය මූලාශ්‍රය **දෙකක්** ඇසුරෙන් දක්වන්න.

(iii) 1970 දශකයේ නර්තන කලා අධ්‍යාපනයේ ප්‍රවර්ධනයට ලැබුණු රාජ්‍ය අනුග්‍රහය සාධක **හතරක්** ඇසුරෙන් විමසන්න.

## II කොටස

**3.** දේශීය ශාන්තිකර්මවල ඒ ඒ නර්තන සම්ප්‍රදායන්ට ආවේණික ලක්ෂණ මෙන් ම සමාන ලක්ෂණ ද විද්‍යමාන වේ.

(i) 'වලියක් මංගල්‍යය' හා බැඳුණු චාරිත්‍ර විධි **දෙකක්** නම් කර, එහි අනන්‍යතා ලක්ෂණ පිළිබඳ සාකච්ඡා කරන්න.

(ii) 'රටයකුම' ශාන්තිකර්මය පැවැත්වීමේ අරමුණු පැහැදිලි කර, එහි 'දරු නැළවිල්ල' පෙළපාළි අංගය පිළිබඳ විග්‍රහයක් කරන්න.

(iii) 'කිරි මඩුව' ශාන්තිකර්මයෙහි ආවේණික ලක්ෂණ, එහි නාට්‍යමය පෙළපාළි **දෙකක්** ඇසුරෙන් ඇගයීමක් කරන්න.

ගුහදණ්ඩ තාලය සිංදු වන්නමේ ඉරට්ටිය

| ^ 1 | 2 | 3 | / 1 | 2 | 3 | 4 | ^ 1 | 2 | 3 | / 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| දොම් | - | ග | දිත් | - | තත් | - | ග | දි | ත | ගුහි | තිග | දිරි | කිට |
| දෙ | ග | ත | ගු | ඳ | ග | ත | ග | ත | කු | දොම් | - | ගදි | ගත |
| දොම් | - | ත | දොම් | - | ග | ත | ග | දි | ත | ගුහි | තිග | දිරි | කිට |
| තා | - | - | දොම් | - | ග | ත | ග | දි | ත | ගු | ඳි | ගු | ඳ |
| තා | | | | | | | | | | | | | |

මේඝ වන්නමේ අඩව්ව

| ^ 1 | 2 | 3 | / 1 | 2 | 3 | 4 | ^ 1 | 2 | 3 | / 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ජිං | - | ත | ග | ත | ග | ත | ග | ති | ත | ග | ත | ග | ත |
| ග | ජිං | - | ගත් | - | තත් | - | ග | තත් | - | ජෙං | - | ජෙං | - |
| ග | තත් | - | කුං | - | දිං | - | ග | තත් | - | කුං | - | දිං | - |
| ග | තත් | - | කුං | - | දිං | - | ග | තත් | - | කු | ඳ | කු | ඳ |
| දොං | - | ත | කුන් | දත් | තරි | කිට | ග | තත් | - | කු | ඳ | ග | ත |
| තා | - | - | ගත් | - | තත් | - | ග | තත් | - | කු | ඳ | ග | ත |
| තා | | | | | | | | | | | | | |

හෝ

| ^ 1 | 2 | 3 | / 1 | 2 | 3 | 4 | ^ 1 | 2 | 3 | / 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ජිං | - | ත | ග | ත | ග | ත | ජි | ග | ත | ග | ත | ග | ත |
| ග | ජිං | - | ගත් | - | තත් | - | ග | තත් | - | ජෙං | - | ජෙං | - |
| ග | ජිං | - | ගත් | - | තත් | - | ග | ජිං | - | ගත් | - | තත් | - |
| ග | ජිං | - | ගත් | - | තත් | - | ග | තත් | - | ජෙං | - | ජෙං | - |
| දොං | - | ත | ගත් | - | තත් | - | ග | තත් | - | කු | ඳ | ග | ත |
| තා | - | - | ගත් | - | තත් | - | ග | තත් | - | කු | ඳ | ග | ත |
| තා | | | | | | | | | | | | | |

*නිවැරදි විභාගවලට වෙන් කිරීම හා සංකේත භාවිතයට ලකුණු 02*

*පද නිවැරදිව ප්‍රස්තාර කිරීමට ලකුණු 04*

*මුළු ලකුණු 06*

(iii) මංගලම් නර්තනයට අදාළ කස්තිරම තුන් සුළු දෙමහ පස්තිතට ප්‍රස්තාර කරන්න.

| ^1 | 2 | ^1 | 2 | ^1 | 2 | /1 | 2 | 3 | 4 | /1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ගත් | - | ජිත් | - | තත් | - | ජිං | - | ත | ක | ත | රි | කි | ට |
| ග | ජිත් | - | කු | ඳත් | - | ජි | කු | ත | ක | ත | රි | කි | ට |
| ග | ත | කු | කු | දත් | - | ජි | කු | ත | ක | ත | රි | කි | ට |
| ග | ත | කු | ඳ | කු | ඳ | තා | - | ත | ක | ත | රි | කි | ට |
| ත | ක | ජිත් | - | තත් | - | ජිං | - | ත | ක | ත | රි | කි | ට |
| ග | ජිත් | - | කු | ඳත් | - | ජි | කු | ත | ක | ත | රි | කි | ට |
| ග | ත | කු | කු | දත් | - | ජි | කු | ත | ක | ත | රි | කි | ට |
| ග | ත | කු | ඳ | කු | ඳ | තා | - | ත | ක | ත | රි | කි | ට |
| ගත් | - | ජිත් | - | තත් | - | ජිං | - | ත | ක | ත | රි | කි | ට |
| ග | ජිත් | - | කු | ඳත් | - | ජි | කු | ත | ක | ත | රි | කි | ට |
| ත | ක | ජිත් | - | තත් | - | ජිං | - | ත | ක | ත | රි | කි | ට |
| ග | ජිත් | - | කු | ඳත් | - | ජි | කු | ත | ක | ත | රි | කි | ට |
| ගත් | - | ජිත් | - | තත් | - | ජිං | - | ත | ක | ත | රි | කි | ට |
| ත | ක | ජිත් | - | තත් | - | ජිං | - | ත | ක | ත | රි | කි | ට |
| ග | ත | කු | කු | දත් | - | ජි | කු | ත | ක | ත | රි | කි | ට |
| ග | ත | කු | ඳ | කු | ඳ | තත් | ජිත් | තොං | නං | තා | | | |

*නිවැරදි විභාගවලට වෙන් කිරීම හා සංකේත භාවිතයට ලකුණු 02*

*පද නිවැරදිව ප්‍රස්තාර කිරීමට ලකුණු 06*

*මුළු ලකුණු 08*

02. **දේශීය නර්තන කලාව විකාශනය වීමේ දී රාජ්‍ය අනුග්‍රහය මෙන්ම භාරතීය සංස්කෘතික ලක්ෂණ ද බලපා ඇති බව මූලාශ්‍රය මගින් හෙළි වේ.**

(i) **ගම්පළ යුගයේදී නර්තන කලාවට බලපෑ භාරතීය ආභාසය කෙබඳු දැයි සාධක දෙකක් මගින් පෙන්වා දෙන්න.**

<u>සාධක</u>

- ඇම්බැක්කේ දේවාලයේ සිව්රැස් පනේලයක දක්නට ඇති නළඟනකගේ ලී කැටයම් හි "මණ්ඩියට නැමී සිටින ඉරියව්වෙහි, වම් අත දණහිස මත ද, දකුණු අතින් හම්සපක්ෂ මුද්‍රාව ද, දැක්වෙන නර්තන විලාසය දකුණු ඉන්දීය ලක්ෂණ පෙන්නුම් කරන බව.
- තිසර සංදේශයේ සඳහන් "තහලම් කල බෙර තම්මැට පටහන්තිරි ඩමුරු" ..... යන කවිය ඇසුරෙන් දක්ෂිණ භාරතීය වාද්‍ය භාණ්ඩ නාමද තිබූ බව.
- ඉබන් බතූතාගේ වාර්තාවට අනුව "දෙවුන්දර උපුල්වන් දේවාල නර්තනය ඉන්දියානු දේවදාසි නර්තන ආභාසයෙන් ලත් නර්තන අංගයක් වූ බව.

*සාධක දෙකකට ලකුණු 02*

*විස්තර කිරීමට ලකුණු 04*

*මුළු ලකුණු 06*

(ii) **දඹදෙණි හා කුරුණෑගල යුගවල භාවිත වාද්‍ය භාණ්ඩ පිළිබඳ තොරතුරු සාහිත්‍ය මූලාශ්‍රය දෙකක් ඇසුරෙන් දක්වන්න.**

- ථූප වංශයෙහි පංචතූර්ය නාද යනුවෙන් හඳුන්වන ආතත, විතත, විතතාතත, ඝන, සුසිර යන වර්ග 5 කට අයත් භාණ්ඩ ලේඛනයක් දක්වා තිබීම.
- කුරුණෑගල යුගයේ ලියවුණු සිංහල ථූප වංශයේ සඳහන් ගැටබෙර, පනාබෙර, එකැස් බෙර, දද්දර, මිහිඟු බෙර, පටහ, ලොහබෙර, තප්පු, තලප්පු, මද්දල භෘංගවීණා, නකුල වීණා .......
- දළදා සිරිතෙහි සඳහන් සත් පසද්ව දළහං, මද්දල, මහමඬුකුඩම්, පනාබෙර, මිහිඟු බෙර, ඩැක්කි, උඩැක්කි, තාලම්පට, විරන්දම්, රණරඩග...... යනාදී භාණ්ඩ නාමාවලිය
- උම්මග්ග ජාතකයේ සඳහන් "ඒ වේදේහ රජුගේ විධානයෙන් අතත, විතත, විතතාතත, ඝණ, සුසිර යනාදී පංච වාර්ගික තූර්ය නාද පැවැත්වූහ."
- දඹදෙණි අස්න සඳහන් තවද නිසාන, තම්මැට, දවුල්, ලොහදවුල්, මහදවුල්, පිනදවුල්, තප්පු, තලප්පු, මහබෙර, ලෝහබෙර, පටාබෙර, එකැස්බෙර, පනාබෙර, ගැටබෙර, පොකුරුබෙර, මිහිඟුබෙර, නාදබෙර,වයනාබෙර, මද්දල, වීරන්දම්, මහුමකුඩම්, අතතය, විතතය, ඝනය, සුසිරය යනාදී බෙරි ඝෝෂාවෙන් සහ සොරණ වීණා, කොම්බු, දාරසක්, දකුණුසක්, විදුරුසක්, රිදීසක්, කරසක්, නාගස්වරම් .......

*මූලාශ්‍රය දෙක - ලකුණු 02*

*මූලාශ්‍රය 2 ක් ඇසුරෙන් තොරතුරු දක්වා තිබීමට ලකුණු 04*

*මුළු ලකුණු 06*

(iii) **1970 දශකයේ නර්තන කලා අධ්‍යාපනයේ ප්‍රවර්ධනයට ලැබුණු රාජ්‍ය අනුග්‍රහය සාධක හතරක් ඇසුරෙන් විමසන්න.**

1972 - අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ පාසල් විෂය මාලාවට සෞන්දර්ය විෂයය අනිවාර්ය කිරීම.

1972 - සෞන්දර්ය ගුරු පුහුණු කිරීම සඳහා ගිරාගම සෞන්දර්ය ගුරු විදුහල ආරම්භ කිරීම.

1974 - රජයේ නැටුම් හා මුද්‍රා නාට්‍ය විද්‍යාලය, ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ සෞන්දර්ය අධ්‍යයන ආයතනය නමින් හැඳින්වීම.

1975 - ජා.පො.අ.ස. විභාගය සඳහා සෞන්දර්ය විෂයයන් යටතේ ප්‍රථම වතාවට නර්තන විෂයට පෙනී සිටීමට අවස්ථාව ලබාදීම.

1976 - අ.පො.ස. (උ.පෙළ) විෂය ධාරාවට, සෞන්දර්ය විෂය ඇතුළත් වීම.

1977 - පෙරදිග සංගීත හා නැටුම් විභාගය, ජාතික නැටුම් සංගීත විභාගය නමින් ප්‍රතිසංවිධානය කිරීම.

1978 - කැලණිය විශ්වවිද්‍යාලයේ, සෞන්දර්ය අධ්‍යයන ආයතනය ප්‍රතිසංවිධානය කිරීම.

1978 - අ.පො.ස. (උ.පෙළ) විභාගයේ නර්තන විෂයය ආරම්භ කිරීම.

*සාධක 04 ක් නම් කිරීමට ලකුණු* 04

*විමසීමට ලකුණු* 04

*මුළු ලකුණු* 08

## II කොටස

03. දේශීය ශාන්තිකර්මවල ඒ ඒ නර්තන සම්ප්‍රදායන්ට ආවේණික ලක්ෂණ මෙන්ම සමාන ලක්ෂණ ද විද්‍යමාන වේ.

(i) වලියක් මංගල්‍යය හා බැඳුණු චාරිත්‍ර විධි දෙකක් නම් කර, එහි අනන්‍යතා ලක්ෂණ පිළිබඳ සාකච්ඡා කරන්න.

- තේවා වාදනය සමඟ පූජා චාරිත්‍ර ආරම්භ කරන බව.
- පරහඳ ගෑමෙන් පසු වලියක් මංගල්‍ය ආරම්භ කරන බව.
- පළමු දිනයේ සිට සත්වන දිනය දක්වා නියමිත වේලාවන් අනුව තේවා හේවිසි වාදනය ආරම්භ කරන බව.
- ගවර මල වටා මඩුපුරය හා මල්පදය පමණක් නර්තනය කරන බව.
- කොහොඹා කංකාරියේ නාට්‍යමය ලක්ෂණ දැක්වෙන වැදි යක්කම, නයා යක්කම, මහ යක්කම යන පෙළපාලි රඟ දක්වන අතර ඌරා යක්කම රඟ නොදක්වන බව.
- කාලියාම, ගරායකුන් නැටීම, ගුරුගේමාලාව ඇවැන්දුමේ දොඟරෝ ජිං ගත වට්ටම, කීල බැඳීම, චාරිත්‍ර වශයෙන් ඉදිරිපත් කරන බව.

*චාරිත්‍ර විධි දෙකක් නම් කිරීම ලකුණු 02*

*අනන්‍යතා ලක්ෂණ පිළිබඳ සාකච්ඡා කිරීමට ලකුණු 04*

*මුළු ලකුණු 06*

(ii) රටයකුම ශාන්තිකර්මය පැවැත්වීමේ අරමුණු පැහැදිලි කර, එහි දරු නැළවිල්ල පෙළපාලි අංගය පිළිබඳ විග්‍රහයක් කරන්න.

<u>අරමුණු</u>

- ගැබ් ගත් ස්ත්‍රීන් ගේ ගර්භය ආරක්ෂා කරගැනීම සහ දරුපල නැති ස්ත්‍රීන්හට දරු ගැබ් අපේක්ෂාවෙන් කරනු ලබන ගර්භ සංරක්ෂණ ශාන්තිකර්මයක් බව.

<u>දරු නැළවිල්ල</u>

- රටයකුම ශාන්තිකර්මයේ අන්තර්ගත නාට්‍යමය පෙළපාලියක් බව.
- කාන්තා වෙස්ගත් ඇදුරා ස්ත්‍රී ලාලිත්‍ය ඔප් නැංවෙන පරිදි කවි කියමින් දරුවා නැලවීම, නැහැවීම, කිරිදීම වැනි දරු සෙනෙහසේ භාවමය ලක්ෂණ නාට්‍යානුසාරයෙන් රඟ දක්වන බව.
- දරුපල අපේක්ෂාවෙන් සිටින කාන්තාවන්ගේ භාවාත්මක හැඟීම් අවදි කරන බව.
- කාන්තාවකගේ මානසික තත්ත්වය චිකිත්සාවට ලක්වන බව.

*අරමුණු පැහැදිලි කිරීමට ලකුණු 02*

*පෙළපාලි අංගය විස්තර කිරීමට ලකුණු 04*

*මුළු ලකුණු 06*

(iii) 'කිරිමඩුව' ශාන්තිකර්මයෙහි ආවේණික ලක්ෂණ එහි නාට්‍යමය පෙළපාලි දෙකක් ඇසුරෙන් ඇගයීමක් කරන්න.

- සබරගමු නර්තන සම්ප්‍රදායේ ගව පට්ටි සංරක්ෂණය සඳහා කරනු ලබන ශාන්තිකර්මයක් බව.
- නාට්‍යමය පෙළපාලි ලෙස නුගේ හෑල්ල, මී කැඩීම, ඇත් බන්ධනය හා මී බන්ධනය සිදු කෙරෙන බව.
- සම්ප්‍රදායික අනන්‍යතා ලක්ෂණ,

  රංග සැරසිලි, රංග උපකරණ,

  නාට්‍යමය රංගන අවස්ථා තුළ ඇති ග්‍රාම්‍ය ලක්ෂණ පෙන්නුම් කරන බව.

*නාට්‍යමය පෙළපාලි නම් කිරීමට ලකුණු 02*
*ආවේණික ලක්ෂණ විස්තර කිරීමට ලකුණු 06*
*මුළු ලකුණු 08*

04. සිංහල ශාන්තිකර්මවල අභිමතාර්ථ ඉටුකරගැනීමේදී උපත්කථා, නාට්‍යමය පෙළපාලි හා සැරසිලි ක්‍රම උපයෝගී කොටගෙන තිබේ.

(i) "වෛරය නිසා ඇතිවන සමාජ ව්‍යසනයන් " පිළිබඳ සන්නියකුම ශාන්තිකර්මයේ උපත් කතාවක් ඇසුරෙන් විමසුමට ලක් කරන්න.

- සන්නියකුමේ <u>සංඛපාල කතාව</u> හෝ <u>දුං උදියාගේ</u> කතාව ඇසුරෙන් නිදසුන් සහිතව සනාථ කළ හැකි බව.
- වෛරය, ක්‍රෝධය, පළිගැනීම, බොරුකීම, කේලම් කීම වැනි අයහපත් ක්‍රියාවල ප්‍රතිඵල ලෙස - පවුල් සංස්ථාව බිඳ වැටීම

  - මාතෘත්වයේ මානසික අසහන තත්ත්වයක් ඇති වීම.
  - මාපිය සෙනෙහස අහිමිවීමෙන් ඇතිවන පල විපාක.

*උපත් කථාවට ලකුණු 02*
*විමසුමට ලක්කිරීමට ලකුණු 04*
*මුළු ලකුණු 06*

(ii) "ඌරා යක්කමේ" හෝ "පොත්කඩේ යක්කමේ" හෝ චරිත නිරූපණය විචාරයට ලක් කරන්න.

<u>ඌරා යක්කම</u>

- කොහොඹා කංකාරියේ යක්කම් 5 ට ඇතුළත් නාට්‍යමය අවස්ථාවක් බව.
- කංකාරි උපත් කථාවෙහි දැක්වෙන මලය රජුගේ උයන විනාශ කළ පුවතට සම්බන්ධවන බව.
- හාස්‍ය මුසුවන දෙබස්, උපහාසාත්මක කවි මගින් චරිත නිරූපණය කරන බව.

  උදා - • තෙමාලා රෙද්ද හැළියේ ඔබන කොට.......

  • කපාලා දෙමුය ගම මහගෙ බරට ගාතයක් .......
- චරිත නිරූපණයේදී වෙස් ඇඳුමෙන් සැරසුණු යක්දෙස්සා බෙරකරු සමඟ ඔබමොබ යමින් සංවාදයේ යෙදෙන බව.
- කෙසෙල්බඩ, ලී කෝටු යොදාගනිමින් සකසා ඇති ඌරාගේ අනුරුවක් රංග භූමියෙහි තැබීමේ පරමාර්ථය.

- වාචික අභිනය ප්‍රධාන කොට, ආංගික, සාත්වික අභිනයන් අඩුවැඩි වශයෙන් යොදා ගෙන ඇති බව.
- හාස්‍ය රසය දැනවීම සඳහා ප්‍රේක්ෂකයන් වෙතට ව්‍යංගාර්ථ සපයමින් නාට්‍යමය ලක්ෂණ පෙන්නුම් කරන බව.

<u>පොත්කඩේ යක්කම</u>

- පොත්කඩේ පාළිය, පොත්-කඩේ යක්කම, පොත්කඩේ යක්කම, පොක්කඩේ නමින්ද හඳුන්වන බව.
- සබරගමු ශාන්තිකර්මවලට ආවේණික පෙළපාළියක් බව.
- සුදු රෙදිකඩ මත තැබූ බුලත් හුරුල්ල මෙනමින් හඳුන්වන බව.
- පහන්මඩු ශාන්තිකර්මයේ හත්පද පෙළපාලියේ, දළුමුර පෙළපාලියට ප්‍රථම ඉදිරිපත් කෙරෙන පෙළපාලියක් බව.
- වාචික අභිනය ප්‍රධාන කොට ආංගික, සාත්වික අභින අඩුවැඩි වශයෙන් යොදා ගෙන ඇති බව.
- නෙල්ලිකොත්තුවා හෙවත් අතෝරකරු රංගන කාර්යයට දායක වුවත් සංවාද සඳහා සහභාගී කොට නොගන්නා බව.
- හාස්‍ය රසය දැනවීම සඳහා ප්‍රේක්ෂකයා වෙතට ව්‍යංගාර්ථ සපයමින් නාට්‍යමය ලක්ෂණ පෙන්නුම් කරන බව.

*චරිත නිරූපන විචාරයට ලක්කර තිබීමට ලකුණු 06*

(iii) **බලි ශාන්තිකර්මයෙහි දක්නට ලැබෙන ඇඹුම් ශිල්පක්‍රම, වර්ණ ගැන්වීම, සැරසිලි හා අමුද්‍රව්‍යවල සුවිශේෂත්වය පිළිබඳ විග්‍රහයක් කරන්න.**

- ඇඹුම් ශිල්ප ක්‍රම
  - උතුරින් ඇති තුඹසකින් හුඹස් මැටි ගන්නා බව.
  - සඳුන් කිරි පැන් ඉස මැටි පේ කරගන්නා බව.
  - නේත්‍රා තැබීම සිදුකරන බව.
- වර්ණ ගැන්වීම
  - ස්වභාවිකව යොදාගන්නා අමුද්‍රව්‍ය භාවිතා කරමින් බලි වර්ණ ගන්වන බව.
  - පොල් කටු අඟුරු, ගුරු ගල්, කොළ යුෂ, කිරිමැටි, කහ කුඩු, නිල් කුඩු වැනි ද්‍රව්‍ය භාවිතා කරන බව.
- සැරසිලි හා අමුද්‍රව්‍ය
  - බලි මඩුව හා මැස්ස තැනීම.
  - අටමගල තැනීම.
  - මල් බුලත් පුටුව සැකසීම.
  - කෙසෙල් පතුරු, හබරල කොළ, ගොප් කොළ, වර්ණවත් මල් වර්ග ......

*ඉහත කරුණු ඇසුරින් විග්‍රහ කර තිබීමට ලකුණු 08*

05. ගැමි නැටුම් හා ගැමි නාටකවලින් ආගමික, සමාජ හා සංස්කෘතික ජීවන රටාව පිළිබිඹු වේ.

(i) ගැමි නැටුම්වලට අදාළ ගායනා 2 ක් මගින් ගැමි ඇදහිලි හා විශ්වාස පිළිබඳ පැහැදිලි කරන්න.

- ගැමි ඇදහිලි හා විශ්වාස මත ගැමි ගායනා නිර්මාණය වී ඇති බව.
  - වරම් වරම් ඉරසඳදෙව් අනින් වරම් ......
  - මල් මාලා සොඳ වරම් ලබනවා ......
  - බෝ අත්තට වැඳ සිරස නමන්නේ .......
  - හිරු දෙවියන්ගේ ඉර ගල ගාවා......

*ඉහත උදාහරණ හෝ වෙනත් අදාළ කවි දෙකක් ලියා තිබීමට ලකුණු 02*
*එම කවි ඇසුරෙන් ඇදහිලි හා විශ්වාස පිළිබඳ විස්තර කිරීමට ලකුණු 04*
*මුළු ලකුණු 06*

(ii) "ගැමි නැටුම්වලින් සමාජ සහයෝගීතාව මෙන්ම සාරධර්ම සංවර්ධනය කෙරේ." විමසන්න

- සමාජ සහයෝගීතාවය දක්වා ඇති ගායනා උදාහරණයට ගෙන තිබීම.
  - උඩහ ගෙදර රන්කිරි නංගිලත් ඇවිල්ලා .......
  - අක්කන්ඩියේ යමු අපි පන් නෙලන්නට ......
  - ජේළි ගැසී අඟනෝ සැරසීලා .......
  - බෝගම්බර අපි නෙළුමට යනකොට තිස්දෙන්නෙක් නෙලතෙයි තානම් ......
- දේව ඇදහිලි හා විශ්වාස මත සාරධර්ම සංවර්ධනය වන බව.
- ප්‍රාදේශීය වශයෙන් පුද ලබන දෙවිවරු පිළිබඳ කවි ගායනා වලින් සාරධර්ම සංවර්ධනය වී ඇති බව.

*ඉහත කරුණු ඇසුරෙන් විමසා තිබීමට ලකුණු 06*

(iii) "ජස හා මුදලි චරිත නිරූපණවලින් තත්කාලීන සමාජ අත්දැකීම් විවරණය කරයි." මෙම ප්‍රකාශය පිළිබඳ අදහස් දක්වන්න.

- අව්‍යාජත්වය චරිත තුළ දක්නට ඇති බව.
- රංගවස්ත්‍ර හා වෙස් මුහුණුවලින් චරිත ස්වභාවය තීව්‍ර කර දැක්වෙන බව.
- ජස හා මුදලි චරිත මගින් ඔවුන්ගේ ක්‍රියා කලාපයන් හාස්‍යයට, උපහාසයට ලක්කර ඇති බව.

  උදා - බීමත්කම, සුරාව, පවුල් සංස්ථාව තුළ ඇති නොසන්සුන් කම, අඹුසැමි ආරවුල්, රාජකාරිය පැහැරහැරීම, අල්ලස පිළිබඳ සමාජ විවරණයක් ඇති බව.
- තමාට හිමි වගකීම් හා වගවීම් තේරුම් නොගන්නා බව.
- එම චරිත ස්වභාවයන්ට අනුකූල නර්තන, ගායන, වාදන අංගයන්ගේ සහසම්බන්ධතාවය මනාව නිරූපණය කිරීම හා එමගින් ප්‍රේක්ෂකයන්ට වින්දනය හා පණිවිඩයක් ලබාදෙන බව.
- රංග වස්ත්‍රාභරණ, වෙස් මුහුණු රංග භාණ්ඩ සතර අභිනය මතුකරලීමට පිටිවහලක් වී ඇති බව.

*ඉහත කරුණු ඇසුරෙන් සමාජ අත්දැකීම් විවරණය කර තිබීමට ලකුණු 08*

## III කොටස

06. පහත සඳහන් වගුවෙහි (අ), (ආ) සහ (ඉ) යන කොටස්වලට අදාළ ව අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) (අ) කොටස - භරත නාට්‍යයම් නර්තන සම්ප්‍රදායට අයත් නර්තන අංගය තෝරා එහි සුවිශේෂ ලක්ෂණ විස්තර කරන්න.

<u>වර්ණම්</u>

- දීර්ඝතම, අසීරුවූත් නර්තන අංගයක් බව.
- නෘත්ත, නෘත්‍ය චලන ලක්ෂණ වලින් සමන්විත බව.
- භරත නර්තන ශිල්පියාගේ හෝ ශිල්පිනියගේ හෝ දක්ෂතාවය මැන බැලීමට හැකි බව.
- භාව ප්‍රකාශනයන්, අංගචලන වල ශුද්ධ බව, සංකීර්ණ ලය, තාල මත පිහිටා ඇති බව.
- ශ්‍රම ශක්තිය, දරාගැනීමේ හැකියාව, නර්තනයේ ගැඹුරු බව වර්ණම් වලින් ප්‍රකට වන බව.
- ශිව, පාර්වතී, ක්‍රිෂ්ණා, රාමා, සීතා වැනි දේව චරිත වර්ණනා කොට භක්තිය ප්‍රකාශ කරන බව.

*නර්තන අංගය නම් කිරීමට ලකුණු* 02
*සුවිශේෂ ලක්ෂණ විස්තර කිරීමට ලකුණු* 04
*මුළු ලකුණු* 06

(ii) (ආ) කොටස - රුසියාවේ බැලේ රංග කලාවට අනුග්‍රහය ලබාදුන් රජ නම් කර, ඔහුගෙන් සිදු වූ සේවය අගයන්න.

<u>මහා පීටර් රජු</u>

- ක්‍රි.ව. 1672 ජුනි 09 දින මොස්කව්හි දී උපත ලැබූ බව.
- Pytor Alexeyovich Romanov - පීටර් ඇලෙක්ෂියෝවිච් රොමානොව් නම් ඔහු මහා පීටර් නමින් රුසියාවේ රාජ්‍ය පාලකයා වූ බව.
- ඔහු දෙවතාවක් යුරෝපයේ සංචාරය කිරීමෙන් පසුව පළමුවරට බැලේ රංගකලාව රුසියාවට හඳුන්වා දුන් බව.
- කලාකරුවන්ට ඉතා ඉහළ වැටුපක් ලබාදීම සහ තරුණ කලාකරුවන් යුරෝපා රටවල සංචාරය සඳහා යැවූ බව.
- ශාන්ත පීටර්ස්බර්ග් නගරය ප්‍රතිසංස්කරණය කර අගනගරය බවට පත්කිරීමෙන් පසු රුසියාවේ ප්‍රථම බැලේ රංග පාසල වන ඉම්පිරියල් බැලේ පාසල ස්ථාපිත කිරීම සඳහා අනුග්‍රහය ලබාදුන් බව.

*නම් කිරීමට ලකුණු* 02
*සේවය අගය කර තිබීමට ලකුණු* 04
*මුළු ලකුණු* 06

(iii) (ඉ) කොටස - ඔබ කැමති දේශීය මුද්‍රා නාට්‍යයක් තෝරාගෙන එහි කථා පුවත, සංගීත නිර්මාණය සහ රංග වින්‍යාසය පිළිබඳ විමසීමක් කරන්න.

පටාචාරා / බැරිසිල්

- තේමාවට අදාළ කථාපුවත ලියා තිබේ නම්.
- සංගීත නිර්මාණයේ දී විවිධ සංගීත කණ්ඩ, නාදමාලා භාවිත කර ඇති බව.
- සංගීත නිර්මාණයේ උචිත බව.
- තාක්ෂණික උපක්‍රම, රංගාලෝක ආදිය නිසා ප්‍රාසංගික අත්දැකීමක් කරා ප්‍රේක්ෂකයන් යොමුකර ඇති බව.
- නර්තන වින්‍යාසය යොදාගෙන ඇති ආකාරය පැහැදිලි කළ යුතු බව.
- රංග වින්‍යාසයේ දී මාලිගාවක්, ආශ්‍රමයක් ලෙස තාක්ෂණික ක්‍රම උපයෝගී කරගෙන ඇති බව.
- පසුතල නිර්මාණයන්ගේ උපයෝගීතාවය ඇති බව.

*මුද්‍රා නාට්‍ය නම් කිරීමට ලකුණු 02*

*කථා පුවත, සංගීත නිර්මාණය හා රංග වින්‍යාසය විස්තර කර තිබීමට ලකුණු 06*

*මුළු ලකුණු 08*

07. **ප්‍රාසංගික නර්තනයේ ප්‍රගමනයට පෙරදිග හා අපරදිග නර්තන ප්‍රවණතා බෙහෙවින් බලපා ඇත.**

(i) **නව නර්තනය බිහිවීම සඳහා අද්‍යතන සමාජ රුචිකත්වය බලපා ඇති ආකාරය ඉහත පාඨය ඇසුරෙන් විමසන්න.**

- ගෝලීයකරණය හා තාක්ෂණික දියුණුව නිසා නර්තනය පිළිබඳව තොරතුරු විසරණය වන බව.
- පාරම්පරික මතවාද බිඳවැටීම හා කාන්තාවන් නර්තනයට පිවිස ඇති බව.
- විවිධ ආයතන හා නර්තන කණ්ඩායම් බිහිවී ඇති බව.
  - සංස්කෘතික මධ්‍යස්ථාන, ජාතික තරුණ සේවා සභාවේ බෙල්වුඩ් ආයතනය, ත්‍රිවිධ හමුදා හා පොලිස් නර්තන කණ්ඩායම්, රාජ්‍ය පළාත් නර්තන කණ්ඩායම්
- විවිධ උත්සව සඳහා විවිධ තේමාවන් ඔස්සේ නර්තන නිර්මාණයට පෙළඹී ඇති බව.
  - මංගල උත්සව, පිළිගැනීමේ උත්සව, සමාරම්භක උත්සව හා විවිධ පෙරහැර
- සාම්ප්‍රදායික අරමුණුවලින් බැහැරව නූතන අවශ්‍යතා අනුව නර්තන නිර්මාණ බිහි වී ඇති බව.
- සංගීත සංදර්ශන සඳහා විවිධ නර්තන ඉදිරිපත් කර ඇති බව.
- නර්තන නිර්මාණකරනයේ දී විදේශීය ආභාසය ගෙන ඇති බව.

*ඉහත පාඨය ඇසුරෙන් විමසා තිබීමට ලකුණු 06*